# කැලණිය විශ්වවිද්‍යාලය- ශ්‍රී ලංකාව
# දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## නවක නම්නිකරණ වැඩසටහන - 2025

2024 අධ්‍යයන වර්ෂය සඳහා දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයෙහි ව්‍යාපාර කළමනාකරණවේදී උපාධිය, වාණිජවිද්‍යාවේදී උපාධිය, විද්‍යාවේදී උපාධිය හා ශාස්ත්‍රවේදී උපාධිය සඳහා ලියාපදිංචි වීමට අයදුම්කර, මේවන විට පළමු වාරික මුදල් ගෙවා අදාළ ලියකියවිලි නිසි පරිදි යොමු කරන ලද සිසුන්ට අදාළ නවක නම්නිකරණ වැඩසටහන් පහත සඳහන් පරිදි පැවැත්වීමට අදාළ සියලුම කටයුතු මේ වන විට සූදානම් කර ඇත.

| දිනය | උපාධි පාඨමාලාව | ස්ථානය | Google Map |
|---|---|---|---|
| 2025.05.03 සෙනසුරාදා | ව්‍යාපාර කළමනාකරණවේදී | පීඨ ශ්‍රවණාගාරය, පරිගණක හා තාක්ෂණ පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, යුනිවර්සිටි ඩ්‍රයිව් (University Drive), බුළුගහ හන්දිය, නුවර පාර, කැලණිය. | https://maps.app.goo.gl/CGcCPFdBtiLjdjLy5 |
| 2025.05.04 ඉරිදා | • වාණිජවිද්‍යාවේදී<br>• විද්‍යාවේදී | දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය, නො 56/6, කෝන්ගහවත්ත පාර, නුවර පාර, කිරිබත්ගොඩ | https://maps.app.goo.gl/PQ3g15VdagLKdoyL9 |
| 2025.05.31 සෙනසුරාදා<br>2025.06.01 ඉරිදා<br>2025.06.08 ඉරිදා | ශාස්ත්‍රවේදී | පීඨ ශ්‍රවණාගාරය, පරිගණක හා තාක්ෂණ පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, යුනිවර්සිටි ඩ්‍රයිව් (University Drive), බුළුගහ හන්දිය, නුවර පාර, කැලණිය. | https://maps.app.goo.gl/CGcCPFdBtiLjdjLy5 |

මීට අදාළ ලිපි ලියාපදිංචි තැපැල් මගින් මේ වන විට අදාළ අපේක්ෂකයින් වෙත යොමු කර ඇති අතර එම ලිපියේ සඳහන් පරිදි තමන්ට අදාළ දිනයේ දී පමණක් ඒ සඳහා සහභාගී විය යුතුය.

මෙහි දී සිසුන් සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධතියට (LMS) අදාළ පරිශීලක නාමය (user name) හා මුරපදය (password) සහිත ලියාපදිංචි තහවුරු කිරීමේ ලිපිය, **ශිෂ්‍ය හැඳුනුම්පත,** ශිෂ්‍ය අත්පොත හා විෂය නිර්දේශ පොත් ලබාදීමට නියමිත බැවින් ඒ සඳහා අදාළ අපේක්ෂකයාම සහභාගීවීම අනිවාර්යය බව දන්වමි.

තවද මෙම වැඩසටහන සඳහා සහභාගි වීමේදී පහත දක්වා ඇති ඇඳුමින් සැරසී පැමිණීම වඩාත් සුදුසු බව වැඩිදුරටත් දන්වමි.

පිරිමි - කලු කලිසම හා සුදු කමිසය
ගැහැණු - කලු කලිසම/කලු සාය හා සුදු බ්ලවුසය හෝ සුදු සාරිය

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී
දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
කැලණිය විශ්වවිද්‍යාලය
2025.04.22